ආසාදනය



# කෘමීන් දෂ්ඨ කිරීම

## වැදගත් කරුණු

- බොහෝ සෙයින් කෘමීන් දශ්ඨ කිරීම් ඇතිවන්නේ මුහුණ හෝ අත් වැනි අණාවරන පදෙස් වලය.
- ඇතැම්විට කෘමීන් ඇඳුම් ඇතුලට රිංගාගෙන කෘමීන් දශ්ඨ කිරීම් සමුහයක් වශයෙන් ශරීරයේ ඇතිවිය හැක.
- උෂ්ණත්වය නිසා කැසිල්ල වඩා නරක කරයි.
- එම පදෙස තෙත මුණ පිසනයකින් සිසිල් කිරීම උපකාරිවේ.
- **Antihistamine** ක්‍රීම් උපකාරි විය හැකි නමුත් ශරීරයට නුරුස්සන **(allergy)** ගතිය ගැන සැළකිලිමත් වන්න.
- රාත්‍රීයේදී **Antihistamine** සිරප් උපකාරි විය හැක.
- කැසීම නිසා සම ඉරිතලා ඇත්නම් දැවිල්ල වැළැක්වීම සඳහා විශබීජනාශක පාවිච්චි කරන්න.

## එවා මොනවාද?

නානවිධ කෘමීන් විසින් සමට විදිනු ලබන විෂ(වසක්) toxins (poisons) වලට සමේ අදාල කොටසට පමණක් සීමාවී දක්වන ප්‍රති ක්‍රියාවක් වශයෙන් Insect bite හැඳින්විය හැක. එවා ඉතා පොදු අතර සමහර ළමයි අන් අයට වඩා සංවේදීය. කෘමීන් විසින් සුලු දෂ්ඨ කිරීම් එකක් හෝ කීපයක් ඇති කරණ අතර එවා කසනු ලබන පැල්ලම් වශයෙන් දින කීපයක් තිබේ. සමහරවිට එවායේ විශේෂයෙන් පාදවල බිබිලි නගිනවා ඇත.

## එවා ගටහන්නේ කොහේද?

බොහෝමයක් Insect bite හට ගන්නේ කෘමියාට සම මතුපිටට ලගාවිය හැකි අණාවරන පදෙස් වලටය. කෘමියකු ඇඳුම යටට රිංගා ගිය අවස්ථාවක ශරීරයේ Insect bite සමුහයක් ගට ගනී.

ඇතැම්විට Insect bite කෙරෙහි දරුවාගේ ශරීරයට නොරුස්සන (allergy) ගතියක් දකින්නට ලැබේ. එවිට එවා මුලින් දරුවා දෂ්ඨ කළ තැනට ඈතින් කැළැල් රාශියක් වශයෙන් Insect bite ආකාරයට හට ගනී. උදාහරණයක් වශයෙන් පාදවල ඇතිවු Insect bite එකෙන් ශරීරයේ කඳ සහ අවයව වල කැළලි ඇතිවීමට හේතුවේ. කාලය  ගෙවීමත් සමගම වේවා තැන්පත් වන අතර එම කෘමියාම දරුවා නැවත දෂ්ඨ කළහොත් පැතිරීමට ඉඩ තිබේ.

## එවාට ප්‍රථිකාර කරන්නේ කෙසේද?

කෘමියාගේ ප්‍රධාන අංග ලක්ෂණ කැසීමයි. උෂ්ණත්වය එය වැඩි කරයි. එම පදෙස තෙත මුණ පිසනයකින් සිසිල් කිරීම උපකාරිවේ. සමහර දරුවන්ට calamine දියරය හෝ සිසිල ගෙන දෙන නිශ්පාදන සමට යේදීමෙන් යහපතක් සැළසේ.

Antihistamine ක්‍රීම් ඇතැම්විට යොදන නමුත් ශරීරයට නුරුස්සන (allergy dermatitis) ඇතිවිය හැක. ක්‍රීම් තවරා ඇති තැන පළු මතුවීම ගට ගනී නම් වහාම නතරකළ යුතුය. කැසිල්ල දරුණු නම් සහ දරුවගේ රාත්‍රී නින්දට භාධාවක් නම් පවුලේ වෛද්‍යවරයා විසින් නියම නරණ ලද Antihistamine සිරප් උපකාරී වේ.

අධික ලෙස කැසීම හේතුකොට ගෙන එම පදෙසේ දියරු ගැලීම සහ සිවිය ඇතිවී තිබේ නම් බැක්ටීරියා ආසාදනයක් ඇතිවීමේ අවදානම තිබේ. එසේ වුවහොත් දැවිල්ල වැළැක්වීම සඳහා ප්‍රථිජීවිකයක් අවශ්‍ය වනු ඇත.

# Singhalese - Insect Bites

බොහෝමයක් Insect bite දින පීපයකදී තැන්පත් වේ. කෑසීමේ කැළලි තවදුරටත් ඇත්නම් හෝ තවත් කැළල් හටගන්නේ නම් මෙම කැළලි Insect bite වලට සම්බන්ධ නොවූ වෙනත් දෙයක් නිසා හට ගන්නේදැයි දැනගැනීම සඳහා වෛද්‍යයරයකුගේ උපදෙස් ලබා නැනීම යෙහෙකි.

වැඩිපුර තොරතුරු

ඔබේ මාතෘ සහ ළමා සෞඛ්‍ය හෙදිය

ඔබේ ඖෂද වේදියා

ඔබේ පවුලේ දොස්තර මයා/මිය

© 2002, Department of Dermatology, St. Vincent's Hospital Melbourne, Victoria Parade, Fitzroy, Victoria 3065 Australia.